පූජ්‍ය සූරියවැව අරියධම්ම හිමි

පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය,
කැළණිය විශ්වවිද්‍යාලය.

PAPER

# සිත්ගත් සෙන් කතාවන් හා එහි ප්‍රායෝගික වටිනාකම පිළිබඳ අධ්‍යයනයක්

දර්ශනයක් හා සංස්කෘතියක් වශයෙන් Zen දහමට ඇත්තේ ඉතා දිගු ඉතිහාසයකි. මුල් බුදුසමයේත්, නිකායාන්තරික බුදුසමයේත් නව ප්‍රවණතාවක් ලෙස Zen දහම ප්‍රභවය වී ඇත. Zen යනු ජපන් වචනයකි. සංස්කෘත භාෂාවේදී එය ධ්‍යාන යනුවෙන් ද, චීන භාෂාවේදී චාන් (chan) යනුවෙන්ද හඳුන්වන වචනය ජපානයේ Zen ලෙසින් භාවනා සම්ප්‍රදායයක් ලෙස දියුණුවිය. ප්‍රායෝගික සමාජ ජීවිතය තුළ සතුට හා සෙනෙහස ප්‍රකාශ කිරීමට Zen කතා මහත් පිටුබලයක් සපයති. Zen කතා කෙතරම් ප්‍රායෝගිකත්වයෙන් යුක්තදැයි විමසන කෙනෙකුට පෙනීයන්නේ එහි කතාව ඇත්තේ අඩුවෙනි. ක්‍රියාශීලිත්වයට ඇත්තේ ප්‍රමුඛත්වයකි. කතාවට වඩා වැඩ පිළිබඳ අවධානයක් Zen කතා තුළ විද්‍යමාන වේ. Zen කතාවන්හි මූලිකම අරමුණ වන්නේ කෙනෙකුගේ පැවැත්ම හා ස්වභාවය ප්‍රායෝගිකව දැකීමට නැඹුරු කිරීමයි.

Zen කතා තුළින් මනසෙහි පවතින නා නාවිධ දෘෂ්ටිවාද මතිමතාන්තර ඉවත්කොට, සත්‍ය පසක් කිරීමෙහි පරම අභිලාෂය අවධාරණය කෙරේ.

Zen යනු එහි අර්ථයෙන්ම කෙනෙකුගේ පැවැත්ම පිළිබඳව හා ස්වභාවය පිළිබඳ ප්‍රායෝගිකව දැකීමේ කලාවයි.

Zen කතාවක් කියවීමෙන් ආස්වාදයක් මෙන්ම, ප්‍රායෝගික සමාජමය වටිනාකමක් ද ඇත. බැලූ බැල්මට ඉතා සරල ය. එහෙත් ජීවිතය විනිවිද යා හැකි දාර්ශනික හැඩතලයකින් යුක්තය. බොහෝ දෙනෙකු කියවා රස විඳීමට කැමති Zen කතා තුළින් ජීවිතයට ප්‍රායෝගිකව වටිනා අදහසක් එකතු කළ හැකිය යන්න නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: Zen කතා, මුල් බුදුසමයේ, ජීවිතයට ප්‍රායෝගික